# අධ්‍යාපන අමාත්‍යාංශය

## උසස් අධ්‍යාපන අංශය
## විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ පහත දක්වා ඇති තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සඳහා අංගසම්පූර්ණ ඉංජිනේරු පීඨයක් සහ කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය සඳහා තාක්ෂණ පීඨ තුනක් ඉදිකිරීම සඳහා මෙම ව්‍යාපෘතියට ආසියානු සංවර්ධන බැංකුව (ADB) මගින් අරමුදල් සපයනු ලබයි. ව්‍යාපෘති මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 165 කි. ව්‍යාපෘති කාල සීමාව 2018 සිට 2024 වසර දක්වා වේ.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් මට්ටම | ආයතනය |
|---|---|---|---|---|
| 01 | මූල්‍ය විශේෂඥ | 01 | PS3 | PMU |
| 02 | ව්‍යාපෘති ඉංජිනේරු | 01 | PS4 | PIU (සබරගමුව විශ්වවිද්‍යාලය) |
| 03 | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති නිලධාරී | 01 | PS5 | PMU |
| 04 | ව්‍යාපෘති නිලධාරී | 01 | PS6 | PMU |
| 05 | කළමනාකරණ සහකාර | 02 | **කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 අනුව** | PMU |
| 06 | කළමනාකරණ සහකාර | 01 | | PIU (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) |
| 07 | කළමනාකරණ සහකාර | 01 | | PIU (සබරගමුව විශ්වවිද්‍යාලය) |

PMU= ව්‍යාපෘති කළමනාකරණ ඒකකය PIU= ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය

ඉහත තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සහ පොදු කොන්දේසි පහත පරිදි වේ.

**<u>එක් එක් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්</u>**

**01. මූල්‍ය විශේෂඥ - PS3**

**පහත (i), (ii) හෝ (iii) අවම සුදුසුකම් හා පළපුරුද්ද:**

(i) අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධියක් හා සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තියමය ආයතනයකින් ලබා ගත් ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) / ඒ හා සමාන වෘත්තිමය සුදුසුකමක්

සමඟ

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්දක් ලබා තිබීම

(ii) අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධියක් හා සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තියමය ආයතනයකින් ලබා ගත් ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) / ඒ හා සමාන වෘත්තිමය සුදුසුකමක්

සහ

අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබාගත් පශ්චාත් උපාධියක් හෝ අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තියමය ආයතනයක පූර්ණ සාමාජිකත්වය / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තිමය සුදුසුකමක් ලබා තිබීම

සමඟ

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 09ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්දක් ලබා තිබීම.

(iii) රජයේ දීප ව්‍යාප්ත සේවාවක පළමු පංතියේ නිලධාරියෙකු හෝ අදාල ක්‍ෂෙත්‍රයේ ඒ හා සමාන තනතුරක නිලධාරියකු වීම

සමඟ

පළමු පංතියේ නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර 04ක පලපුරුද්දක් ලබා තිබීම.

**02. ව්‍යාපෘති ඉංජිනේරු PS4 (ඒ කාණ්ඩය)**

**පහත (i) හෝ (ii) අවම සුදුසුකම් හා පළපුරුද්ද:**

(i) අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධියක් හා සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තියමය ආයතනයකින් ලබා ගත් ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) / ඒ හා සමාන වෘත්තිමය සුදුසුකමක්

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර අටක (08) පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්දක් ලබා තිබීම.

(ii) රජයේ දීප ව්‍යාප්ත සේවාවක III/II හෝ ඉහළ පංතියක නිලධාරියෙකු වීම හෝ අදාල ක්ෂෙත්‍රයේ ඒ හා සමාන තනතුරක් දැරීම

සමඟ

II/III පන්තියේ තනතුරක අවම වශයෙන් වසර අටක (08) පළපුරුද්දක් ලබා තිබීම.

**ව්‍යාපෘති ඉංජිනේරු - PS4 (බී, සී, හා ඩී කාණ්ඩ )**
**අවම සුදුසුකම් හා පළපුරුද්ද සඳහා 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 බලන්න.**

**03. ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති නිලධාරී (PS5)**

පහත (i), (ii) හෝ (iii) අවම සුදුසුකම් හා පළපුරුද්ද:

(i) අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධියක් හා සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තියමය ආයතනයකින් ලබා ගත් ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) / ඒ හා සමාන වෘත්තිමය සුදුසුකමක්

හෝ

තාක්ෂණික විෂය ක්ෂෙත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 7වන මට්ටමට නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

නියමිත විශේෂිකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද

(ii) තාක්ෂණික විෂය ක්ෂෙත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 6වන මට්ටමට නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

නියමිත විශේෂිකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද

(iii) තාක්ෂණික විෂය ක්ෂෙත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 5වන මට්ටමට නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

නියමිත විශේෂිකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද

**04.** වයාපෘති නිලධාරි **(PS 6)**

**පහත (i), (ii) හෝ (iii) අවම සුදුසුකම් හා පළපුරුද්ද::**

(i) අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධියක් හා සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තියමය ආයතනයකින් ලබා ගත් ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) / ඒ හා සමාන වෘත්තිමය සුදුසුකමක්

හෝ

තාක්ෂණික විෂය ක්ෂෙත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 7වන මට්ටමට නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

නියමිත විශේෂිකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද.

**(ii)** තාක්ෂණික විෂය ක්ෂෙත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 6වන මට්ටමට නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

නියමිත විශේෂිකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර අටක (08) පළපුරුද්ද

(iii) තාක්ෂණික විෂය ක්ෂෙත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 5වන මට්ටමට නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

නියමිත විශේෂිකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහතුනක (13) පළපුරුද්ද

**05.** කළමනාකරණ සහකාර **(PMU & PIU)**

**අවම සුදුසුකම් හා පළපුරුද්ද පහත පරිදි වේ:**

(i) අ.පො.ස (උ/පෙළ) විෂයයන් තුනක් සමත් වීම හා සිංහල / දෙමළ, ගණිතය හා ඉංග්‍රීසි ඇතුළත් ව සම්මාන සාමාර්ථ හතරක් සහිතව එක් වරක දී අ.පො.ස (සා/පෙළ) විෂයන් හයක් (06) සමත් වීම

සහ

විදේශ අරමුදල් ව්‍යාපෘතියක වසර දෙකක (02) සේවා පළපුරුද්ද

**පොදු කොන්දේසි**

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**1.වයස් සීමාව:**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 64ට අඩු වීම

2. වැටුප :

2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හා අදාළ සංශෝධන අනුව හිමි වැටුප සහ අනෙකුත් දීමනා

3. **සේවා කොන්දේසි**:

නිලධාරීන් වසරක කාලපරිච්ඡේදයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ඇත. කාර්ය සාධනය හා සේවයේ අවශ්‍යතාව අනුව එම කාලය වසරින් වසර තවත් වසර තුනක උපරිම කාලයක් දක්වා දීර්ඝ කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.

**4.අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :**

2021 ජූලි 27

5.**වෙනත් ප්‍රතිලාභ:**

සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවදායකයාගෙන් 8% ක දායකත්වයක් ද, සේවායෝජකයාගෙන් 12% ක දායකත්වයක්ද සහ සේවක භාරකාර අරමුදල සඳහා 3% ක දායකත්වයක් සේවායෝජකයා විසින් ද දරනු ඇත.

ඔබ විසින් ඉල්ලුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. A සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අදාළ තොරතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරමින් අයදුම්කරු පිළිබඳව තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් ද සහිතව තමන් විසින් සකස් කරන ලද අයදුම්පත අවසන් දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාර දීම සිදු කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**363 E, හොරහහකන්ද පාර,**
**තලංගම උතුර,**
**කොස්වත්ත,**
**බත්තරමුල්ල.**

**ලේකම්**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**2021.07.07**